වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயல்திறன் அறிக்கை
Annual Performance Report

2022








කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
தொழில்நுட்பக் கல்வி, மற்றும் பயிற்சித் திணைக்களம்
Department of Technical Education & Training

DTET
SRI LANKA

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2022

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය: 215

අන්තර්ගතය	පිටු අංකය
01 වන පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / විධායක සාරාංශය	01 - 07
02 වන පරිච්ඡේදය - ප්‍රගතිය සහ අනාගත දැක්ම	08 - 13
03 වන පරිච්ඡේදය - වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය	14 - 29
04 වන පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක	30
05 වන පරිච්ඡේදය - තිරසර සංවර්ධන ඉලක්ක (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	31 - 32
06 වන පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ	33 - 34
07 වන පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව	35 - 40

1 වන පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / විධායක සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ විධිමත් පරිදි කාර්මික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රියාවලිය ආරම්භ වූයේ 1893 වර්ෂයේ දී රජය විසින් දුම්රිය දෙපාර්තමේන්තුව ආසන්නයේ පිහිටා තිබූ ප්‍රතිසංස්කරණය කරන ලද කෝපි ගබඩාවක මරදාන කාර්මික පාසල ස්ථාපනය කිරීමත් සමඟය. මෙම විද්‍යාලය මේ වන විට වසර 130 ක අභිමානවත් සේවා කාලයක් සම්පූර්ණ කර ක්‍රියාත්මක වෙමින් පවතී. ශ්‍රී ලංකා අධ්‍යාපන පනත යටතේ ආරම්භවූ කාර්මික පාසල් ජාලයක් දිවයින පුරා පිහිට වූ අතර 1994 වර්ෂයේදී කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව 1 වන ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපනය කරන ලදී. වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම දෙපාර්තමේන්තුව යටතේ තාක්ෂණ විද්‍යාල 09 ක් හා කාර්මික විද්‍යාල 30ක් ක්‍රියාත්මක වේ . දිවයින පුරා පිහිටුවා ඇති තාක්ෂණ හා කාර්මික විද්‍යාල ජාලය මගින් පාසැල් හැර ගිය හා රැකියා අපේක්ෂිත තරුණ තරුණියන්හට නවීන කාර්මික හා තාක්ෂණික පුහුණුවක් ලබා දෙමින් දේශීය හා විදේශීය රැකියා වෙළඳපොලේ විවිධ ක්ෂේත්‍රයන්හි රැකියා සඳහා මංපෙත් විවරකර දෙනු ලබයි. මෙම තාක්ෂණ හා කාර්මික විද්‍යාල 39 මඟින් NVQ සහ සහතික පත්‍ර පාඨමාලා සියයකට වැඩි ප්‍රමාණයක් විවිධ කර්මාන්ත අංශ 17 ක් යටතේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ.

සියළුම කාර්මික විද්‍යාල මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් 3,4 හා සහතිකපත්‍ර පාඨමාලා පවත්වයි. සුදුසුකම් ලත් සිසුන්හට දිවයිනේ පළාත් 9 හි පිහිටි තාක්ෂණ විද්‍යාල මඟින් NVQ 5 සහ 6 මට්ටමේ ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා පාඨමාලා හැදෑරිය හැකි අතර රටේ ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රියාවලිය හරහා පුහුණුලාභීන්ගේ නිපුණතා නුපුහුණු මට්ටමේ සිට ප්‍රවීණ ශිල්පී මට්ටම දක්වා උසස් කිරීමට හැකියාව ලැබී ඇත. එසේම ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමාධාරීන්ට NVQ 7 මට්ටමේ සුදුසුකම් ලබාගැනීම සඳහා වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයට (UNIVOTEC) ඇතුළු විය හැකි අතර එමඟින් සිසුන්ට තාක්ෂණවේදී උපාධියක් හෝ අධ්‍යාපන තාක්ෂණ උපාධියක් ලබා ගැනීමට ඉඩ සැලසේ.

මෝටර් කාර්මික තාක්ෂණය, කෘෂිකර්ම නිෂ්පාදන හා ගොවිපල යන්ත්‍රෝපකරණ තාක්ෂණය, ආහාර තාක්ෂණය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, මෙකාට්‍රොනික්ස් තාක්ෂණය, ශීතකරණ සහ වායු සමීකරණ තාක්ෂණය, විදුලි සංදේශන තාක්ෂණය, ඉදිකිරීම් තාක්ෂණය, වෙල්ඩින් තාක්ෂණය සහ නිෂ්පාදන තාක්ෂණය ඇතුළු පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා තාක්ෂණ හා කාර්මික විද්‍යාලයන්හි පවත්වාගෙන යන අතර තත්ත්ව සහතික පද්ධතියක් යටතේ අඛණ්ඩව පුහුණු ක්‍රමවේදය ඇගයීම් කර මෙම පාඨමාලා තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් ප්‍රතිනතය කර ඇත. කාලීන රැකියා වෙළඳපල අවශ්‍යතාවයන්ට සපුරාලීම සඳහා නව රැකියා ඉලක්ක කරගත් පුහුණු වැඩසටහන් හඳුන්වාදීම සඳහා වරින් වර විෂයමාලා සකස් කරනු ලබන අතර පවතින පාඨමාලා නවීන තාක්ෂණයට ගැලපෙන පරිදි අඛණ්ඩව සංශෝධනය කෙරේ.

පසුගිය වසර 130 ක කාලය තුල දිනෙන් දින විකාශනය වූ ගෝලීය කාර්මික ක්ෂේත්‍රයන්ට ගැලපෙන පරිදි කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පද්ධතිය සැලකිය යුතු ලෙස යාවත්කාලීන කර ජාතික මෙන්ම ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොල ඉල්ලුමට සරිලන පරිදි මානව සම්පත සංවර්ධනය කිරීමට කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව කැපවී සිටින අතර නිපුණතා ගොඩනැගීම තුලින් මානව සම්පත සංවර්ධනය කර දැනුම පදනම් කරගත් ආර්ථිකයක් සහිත ඉහල මැදි ආදායම්ලාභී රටක් බවට පරිවර්තනය කිරීම සඳහා මහත් දායකත්වයක් ලබා දෙනු ලැබේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ජාත්‍යන්තරව උසස් පිළිගැනීමකින් යුත් කාර්මික අධ්‍යාපනය හා පුහුණුව ලබාදීමේ ප්‍රමුඛයා වීම.

මෙහෙවර

අපගේ සේවාලාභීන්ට උසස් තත්වයෙන් යුත් දේශීයව හා ජාත්‍යන්තරව පිළිගත් කාර්මික අධ්‍යාපනය හා පුහුණුව ලබා දෙන ආයතනය ලෙස කටයුතු කිරීම.

අරමුණු

- පාසල් හැර යන තරුණ තරුණියන්ට සහ රැකියාවල නියුතු පුද්ගලයන්ට තාක්ෂණික අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම.
- තාක්ෂණ හා කාර්මික අධ්‍යාපනය තුළින් උපාධි මට්ටමට ළඟා වීමට මාර්ගයක් නිර්මාණය කිරීම.
- රටේ ආර්ථික සංවර්ධනය සඳහා මානව ප්‍රාග්ධනය සැපයීම.
- ස්වයං රැකියා සහ කර්මාන්ත අංශයට මහ පෙන්වන නිපුණතා සැපයීම.
- 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන හා තාක්ෂණ විෂය ධාරාව හදාරන සිසුන්හට කාර්මික අධ්‍යාපන අවස්ථා සලසා දීම.

1.3 කාර්යයන්

- කාර්මික අධ්‍යාපනය හා ඒ හා සම්බන්ධ පුහුණු වැඩසටහන් හඳුනා ගැනීම, සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, මඟ පෙන්වීම, අධීක්ෂණය සහ සම්බන්ධීකරණය.
- කාර්මික අධ්‍යාපනය සහ පුහුණු කිරීම වඩාත් ඵලදායී හා කාර්යක්ෂම කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය.
- කාර්මික අධ්‍යාපනය හා පුහුණු ක්‍රමය තුල අනුමත ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) රාමුවට අනුව පාඨමාලා ක්‍රියාත්මක කිරීම.
- වෘත්තීය මාර්ගෝපදේශනය හා ව්‍යවසායකත්ව සංවර්ධනය පිණිස රාජ්‍ය හා පෞද්ගලික අංශ සමග ඒකාබද්ධ ක්‍රියාකාරී වැඩසටහන් සැකසීම, සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම.
- කාර්මික හා තාක්ෂණ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ කටයුතු සිදු කිරීම හා නව නිපැයුම් සඳහා අවකාශ සලසා දීම.

1.4 දෙපාර්තමේන්තුවේ ආයතනික ව්‍යුහය



1.5 දෙපාර්තමේන්තුව යටතේ ඇති අංශයන්

1. පරිපාලන අංශය
2. අධ්‍යයන අංශය
3. පරීක්ෂණ සහ ඇගයීම් අංශය
4. වෘත්තීය මාර්ගෝපදේශන සහ අලෙවි අංශය
5. පර්යේෂණ සහ සංවර්ධන අංශය
6. තාක්ෂණික සහාය සේවා අංශය
7. සැලසුම් අංශය
8. යටිතල පහසුකම් සංවර්ධන අංශය
9. නඩත්තු අංශය
10. මූල්‍ය කළමනාකරණ අංශය
11. කළමනාකරණ තොරතුරු ඒකකය

1.6 දෙපාර්තමේන්තුව යටතේ ඇති පුහුණු මධ්‍යස්ථාන (ඇමුණුම 1)

තාක්ෂණ විද්‍යාල	-	09
කාර්මික විද්‍යාල	-	30

1.7 දෙපාර්තමේන්තුවට ලැබෙන අරමුදල්

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2022 වර්ෂයේ දී විවිධ මූලාශ්‍රවලින් පහත පරිදි අරමුදල් වෙන් කරන ලදී.

	අරමුදල් මූලාශ්‍රය	2022 සඳහා වෙන් කළ ප්‍රතිපාදනය (රු. මී)	2022 සඳහා සංශෝධිත ප්‍රතිපාදනය (රු.මී)	2022.12.31 දිනට වියදම	ප්‍රගතිය %	
					මූල්‍ය	භෞතික
ඒකාබද්ධ අරමුදල						
1.	ප්‍රාග්ධන	310.00	110.00	34.50	32	85
2.	පුනරාවර්තන	2,200.00	2,267.00	2,139.00	97	100
අයවැය යෝජනා						
3.	භෞතික සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (තාක්ෂණික විද්‍යාල වැඩිදියුණු කිරීමේ අවිච්ඡේද ව්‍යාපෘති)	34.36	34.36	25.10	75	100
4.	අයවැය යෝජනා යටතේ ටෙක් උදාන ව්‍යාපෘතිය (මාතර සහ මරදාන විද්‍යාල වැඩිදියුණු කිරීම)	37.50	37.50	7.40	20	45
විදේශීය ප්‍රදාන						
5.	කාර්මික හා තාක්ෂණ විද්‍යාල වල ඉදිකිරීම් පාඨමාලා වල ධාරිතාව වර්ධන ව්‍යාපෘතිය)	78.30	78.30	46.16	58	30
	එකතුව	2,660.16	2,527.16	2,252.24		

1.7.1 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති පිළිබඳ විස්තර

ශ්‍රී ලංකාවේ කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලවල ඉදිකිරීම් පාඨමාලා වල ධාරිතා වර්ධනය සඳහා කොරියානු ආධාර ව්‍යාපෘතිය

කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (**KOICA**) මඟින් ලබා දෙන ඇමරිකානු ඩොලර් මිලියන 4ක වටිනාකමින් යුතු ප්‍රදානයක් හරහා ක්‍රියාත්මක වන තෝරාගත් තාක්ෂණ හා කාර්මික විද්‍යාල 4 ක ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පාඨමාලාවල ධාරිතා වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2021 - 2024 කාල රාමුව තුළ ක්‍රියාත්මක වන අතර මේ වන විට මරදාන හා රත්නපුර තාක්ෂණ විද්‍යාලවල හා රත්මලාන හා මාතර කාර්මික විද්‍යාලවල පාඨමාලා සංවර්ධන කටයුතු ආරම්භ කර ඇත. ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ ඉදිකිරීම් අංශයේ පාඨමාලා සංවර්ධනය කිරීම තුලින් ශ්‍රී ලංකාවේ පුහුණු ශ්‍රමිකයන්ගෙන් වැඩි ප්‍රතිශතයකින් ඉදිකිරීම් අංශයේ ශ්‍රම බලකාය වැඩිකිරීමයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ මූලික සමීක්ෂණ කටයුතු කොරියානු නියෝජිතයින් විසින් සිදුකල අතර කොරියානු රජය හා ශ්‍රී ලංකා රජය අතර එකඟතා ගිවිසුම අත්සන් කර පහත සඳහන් ව්‍යාපෘති සංරචක ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්ශවය එකඟ වී ඇත.

අ. ඉගෙනුම් අත්පොත සංවර්ධනය
ආ. පුහුණුකරුවන්ගේ ධාරිතාව ගොඩනැගීම
ඇ.රැකියාගත පුහුණුව ප්‍රවර්ධනය කිරීම.
ඈ. පුහුණු උපකරණ සැපයීම
ඉ. පවතින වැඩහල් ප්‍රතිනිර්මාණය කිරීම

මේ යටතේ ප්‍රතිලාභී විද්‍යාලවල ප්‍රධානීන්, උපදේශකවරුන් හා දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා කොරියානු විශේෂඥයින් විසින් ඉගෙනුම් මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීම හා සංවර්ධනය පිළිබඳ දැනුවත් කිරීම සඳහා මූලික වැඩමුළු දෙකක් පවත්වා සංශෝධනය කිරීමට අවශ්‍ය විෂයමාලා හඳුනාගෙන ඇත. කොරියානු විශේෂඥ කණ්ඩායම විසින් ඉගෙනුම් මාර්ගෝපදේශ යාවත්කාලීන කරමින් පවතී.

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය සඳහා රැකියා ගත පුහුණු (OJT) උපායමාර්ග තුලින් රැකියාගත පුහුණු ක්‍රමවේදය ප්‍රවර්ධනය සඳහා කොරියානු විශේෂඥයින් විසින් වැඩමුළු දෙකක් පවත්වා ඇත. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියෝජිතයින් , ඉදිකිරීම් ක්ෂේත්‍රයේ උපදේශකවරුන් හා ප්‍රතිලාභී විද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් මෙම වැඩසටහනේ ඉලක්කගත කණ්ඩායම විය. තවද ප්‍රතිලාභී විද්‍යාලවල උපදේශකවරුන් හා වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් සහ වෘත්තීය පුහුණු අධිකාරියේ සහ අමාත්‍යාංශයේ වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් ඇතුළුව නිලධාරීන් 20 දෙනෙකු සඳහා රැකියාගත පුහුණු සංස්කෘතිය පිළිබඳව දින 7 ක පුහුණුකරුවන් පුහුණු කිරීමේ (ToT) වැඩසටහනක් පැවැත්විණි.

කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය සහ දෙපාර්තමේන්තුව අතර අත්සන් කළ අවබෝධතා ගිවිසුමට අනුව වැඩහල් ප්‍රතිනිර්මාණය කිරීම කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කර ඇත. රත්නපුර තාක්ෂණ විද්‍යාලය , මාතර හා රත්මලාන යන කාර්මික විද්‍යාලවල ව්‍යාපෘති සඳහා ජාතික තරඟකාරී ලංසු ක්‍රමය මඟින් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගන්නා ලද අතර මරදාන තාක්ෂණ විද්‍යාලයේ වැඩහල් අළුත්වැඩියාව හා නවීකරණ කටයුතු ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශ්‍රම දායකත්වය යටතේ ඉදිකිරීම් අමුද්‍රව්‍ය සැපයීම හරහා ක්‍රියාත්මක වේ. මෙම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ඇස්තමේන්තුගත මුදල ලෙස රු.මි.205.037 ක මුදලක් අනුමත කර ඇත. 2022 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට 30% ක වැඩ ප්‍රමාණයක් අවසන් කර ඇති අතර සියලු ප්‍රතිසංස්කරණ කටයුතු 2023 මාර්තු 31 දිනට අවසන් කිරීමට සැලසුම් කර ඇත. (2022.12.31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත වගුවෙන් පෙන්වා ඇත

2022.12.31 දිනට භෞතික හා මූල්‍ය ප්‍රගතිය

වැය අංකය	කා.වි. තා.වි.	ක්‍රියාකාරකම	අනුමත අයවැය ප්‍රතිපාදන (රු.)	කොන්ත්‍රාත් මුදල (රු.)	ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණය (රු.)	VAT (දේශීය අරමුදල්) (රු.)	2022.12.31 දිනට මුළු වියදම (රු.)	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
	කොරියානු ආධාර ව්‍යාපෘතිය								
126 – 02 – 21 – 14 – 2401 (13)	කා.වි. රත්මලාන	CAD (පරිගණක ආශ්‍රිත චිත්‍රකරණය) විද්‍යාගාරය, කාර්මික චිත්‍රකරණ විද්‍යාගාරය සහ ජලනල තාක්ෂණ වැඩහල ප්‍රතිසංස්කරණය.	62,698,408.58	47,498,794.38	73,800,000		13,213,138,.31	21%	පරිගණක ආශ්‍රිත චිත්‍රකරණය- 35% චිත්‍රකරණ – 33% ජලනල– 32%
	කා.වි. මාතර	CAD (පරිගණක ආශ්‍රිත චිත්‍රකරණය) විද්‍යාගාරය, කාර්මික චිත්‍රකරණ විද්‍යාගාරය සහ ජලනල තාක්ෂණ වැඩහල ප්‍රතිසංස්කරණය.	46,620,034.56	35,318,208.00			9,648,962.40	21%	පරිගණක ආශ්‍රිත චිත්‍රකරණය- 33% චිත්‍රකරණ – 30% ජලනල– 37%
	තා.වි. රත්නපුර	CAD (පරිගණක ආශ්‍රිත චිත්‍රකරණය) විද්‍යාගාරය, කාර්මික චිත්‍රකරණ විද්‍යාගාර සහ ජලනල තාක්ෂණ වැඩහල ප්‍රතිසංස්කරණය.	54,646,664.89	41,398,988.55		1,935,013.68	16,871,259.88	32%	පරිගණක ආශ්‍රිත චිත්‍රකරණය- 32% චිත්‍රකරණ – 32% ජලනල– 36%
	තා.වි. මරදාන	CAD (පරිගණක ආශ්‍රිත චිත්‍රකරණය) විද්‍යාගාරය, කාර්මික චිත්‍රකරණ විද්‍යාගාරය සහ ජලනල තාක්ෂණ වැඩහල ප්‍රතිසංස්කරණය. (අමුද්‍රව්‍ය මිලදී ගැනීම සහ පරිපාලන වියදම)	25,105,283.81	25,105,283.81			3,928,343.53	29%	පරිගණක ආශ්‍රිත චිත්‍රකරණය- 39% ජලනල– 22 %
		CAD (පරිගණක ආශ්‍රිත චිත්‍රකරණය) විද්‍යාගාරය, කාර්මික චිත්‍රකරණ විද්‍යාගාරයන්හි ලී වලින් සාදන ලද බිම සැකසීම.	15,966.720.00	12,096,000.00			2,500,000.00	16%	39% වැඩ අවසන්
		එකතුව	205,037,111.84	161,417,274.74	73,800,000	1,935,013.68	46,161,704.12		

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ උපදේශකවරුන් පුහුණු කිරීමේ ධාරිතා වර්ධන වැඩසටහන ප්‍රතිනිර්මාණය කරන ලද වැඩහල් සඳහා පුහුණු උපකරණ සැපයීමෙන් අනතුරුව 2023 හා 2024 කාල පරිච්ඡේදය තුළ සිදුකිරීමට සැලසුම් කර ඇත.

ඇමුණුම 1

තාක්ෂණ විද්‍යාල සහ කාර්මික විද්‍යාලවල පිහිටීම

පළාත	තාක්ෂණ/කාර්මික විද්‍යාලය
බස්නාහිර	ශ්‍රී ලංකා තාක්ෂණ විද්‍යාලය කොළඹ (මරදාන)
	කාර්මික විද්‍යාලය - ගම්පහ
	කාර්මික විද්‍යාලය - හෝමාගම
	කාර්මික විද්‍යාලය - කළුතර
	කාර්මික විද්‍යාලය - රත්මලාන
දකුණ	තාක්ෂණ විද්‍යාලය - ගාල්ල
	කාර්මික විද්‍යාලය - බලපිටිය
	කාර්මික විද්‍යාලය - බෙලිඅත්ත
	කාර්මික විද්‍යාලය - මාතර
	කාර්මික විද්‍යාලය - වීරවිල
සබරගමුව	තාක්ෂණ විද්‍යාලය - රත්නපුර
	කාර්මික විද්‍යාලය - ඇඹිලිපිටිය
	කාර්මික විද්‍යාලය - කෑගල්ල
	කාර්මික විද්‍යාලය - වරකාපොල
ඌව	තාක්ෂණ විද්‍යාලය - බදුල්ල
	කාර්මික විද්‍යාලය - බණ්ඩාරවෙල
	කාර්මික විද්‍යාලය - මැදගම
	කාර්මික විද්‍යාලය - මොණරාගල
නැගෙනහිර	තාක්ෂණ විද්‍යාලය - අම්පාර
	කාර්මික විද්‍යාලය - අක්කරපත්තුව
	කාර්මික විද්‍යාලය - මඩකලපුව
	කාර්මික විද්‍යාලය - දෙහිඅත්තකණ්ඩිය
	කාර්මික විද්‍යාලය - සමන්තුරේ
	කාර්මික විද්‍යාලය - ත්‍රිකුණාමලය
මධ්‍යම	තාක්ෂණ විද්‍යාලය - මහනුවර
	කාර්මික විද්‍යාලය - දඹුල්ල
	කාර්මික විද්‍යාලය - හසලක
	කාර්මික විද්‍යාලය - මාතලේ
	කාර්මික විද්‍යාලය - නුවරඑළිය
	කාර්මික විද්‍යාලය - පාතදුම්බර
උතුරු මැද	තාක්ෂණ විද්‍යාලය - අනුරාධපුර
	කාර්මික විද්‍යාලය - ප්ලොන්නරුව
වයඹ	තාක්ෂණ විද්‍යාලය - කුරුණෑගල
	කාර්මික විද්‍යාලය - ආණමඩුව
	කාර්මික විද්‍යාලය - කුලියාපිටිය
	කාර්මික විද්‍යාලය - වාරියපොල
උතුරු	තාක්ෂණ විද්‍යාලය - යාපනය
	කාර්මික විද්‍යාලය - වවුනියාව
	කාර්මික විද්‍යාලය - මන්නාරම



2 වන පරිච්ඡේදය

ප්‍රගතිය සහ අනාගත දැක්ම

2.1 ප්‍රගතිය සහ ජයග්‍රහණ

- කර්මාන්ත අංශයේ ක්ෂේත්‍ර 17 ක් යටතේ පවත්වන ලද පාඨමාලා 121 ක් සඳහා තාක්ෂණ විද්‍යාල 09 සහ කාර්මික විද්‍යාල 30 සඳහා 2022 දෙසැම්බර් 31 වන විට සිසුන් 21,992ක් බඳවාගෙන ඇත. පෙර වසරවල බඳවාගත් සිසුන් 8,896 ක් සමඟ 2022 වර්ෂයේදී විද්‍යාල 39 හි සිසුන් 31,577 ක් පුහුණුව ලබා ඇත. පුහුණුව ලැබූ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 41% ක ප්‍රතිශතයක් කාන්තාවන් නියෝජනය කර ඇත.

අංකය	ක්ෂේත්‍රයේ නම	2022 වර්ෂයේ සිසුන් බඳවා ගැනීම්	පෙර වසරවල සිසුන් බඳවා ගැනීම්	13 වසර වැඩසටහන යටතේ බඳවා ගැනීම්	මුළු ශිෂ්‍ය බඳවා ගැනීම්
1	කෘෂිකාර්මික, වැවිලි සහ පශු සම්පත්	1896	865	33	2794
2	මෝටර් රථ අලුත්වැඩියාව සහ නඩත්තුව	3439	1314	418	5171
3	ගොඩනැගිලි ඉදිකිරීම	6075	3573	64	9712
4	විදුලි, ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ	2009	1270	52	3331
5	මූල්‍ය බැංකුකරණය සහ කළමනාකරණය	1316	408		1724
6	ආහාර තාක්ෂණය	162	101		263
7	මැණික් සහ ස්වර්ණාභරණ	30	11		41
8	හෝටල් සහ සංචාරක	258		8	266
9	තොරතුරු සන්නිවේදනය සහ බහුමාධ්‍ය තාක්ෂණය	2619	912	97	3628
10	භාෂා	1271	19		1290
11	සම් භාණ්ඩ සහ පාවහන්	29	14		43
12	මෙකාට්‍රොනික් තාක්ෂණය	240	292		532
13	ලෝහ සහ සැහැල්ලු ඉංජිනේරු විද්‍යාව	849	86	70	1005
14	කාර්යාල කළමනාකරණය	837		1	838
15	ශීතකරණ සහ වායු සමීකරණය	572	31	12	615
16	රෙදිපිළි සහ ඇඟලුම්	223		4	227
17	දැව කර්මාන්තය	97			97
	මුළු එකතුව	21,922	8,896	759	31,577

- 2022 වර්ෂයේ රටේ පැවති සමාජීය හා ආර්ථික අස්ථාවරභාවය හේතුවෙන් විද්‍යාල වල ඉලක්කගත ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගැනීමේ අඩුවක් පැවතුනි.

- 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිර්දේශ කරන ලද වෘත්තීය විෂයධාරා 26 ක් යටතේ පාඨමාලා 30 ක් සඳහා අදියර 3 ක් යටතේ බඳවාගත් සිසුන් 759 ක් කාර්මික විද්‍යාල 29 ක පුහුණුව ලබා ඇත.

- සියලු ජන වාර්ගික කණ්ඩායම් සඳහා පුහුණු අවස්ථා පහසු කිරීම වෙනුවෙන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිවෙළින් පාඨමාලා 90 ක් , පාඨමාලා 59 ක් හා පාඨමාලා 47 ක් ලෙස පාඨමාලා පවත්වන ලදී.

- 2022 වර්ෂයේදී බතික්, බේකරි, සහ ඉවුම් පිහුම්, මැහුම්, කෘෂි කාර්මික තාක්ෂණය, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, ලේකම් පරිචය, යතුරු ලියනය වැනි කාන්තා නැඹුරු පාඨමාලා පවත්වාගෙන යාම සඳහා පහසුකම් පුළුල් කරන ලදී. වෘත්තීය අධ්‍යාපනයට කාන්තා නියෝජනය 41% කට වැඩි ප්‍රතිශතයක් දක්වා වර්ධනය වී ඇති අතර ටෙලරින්, සම්භාණ්ඩ නිෂ්පාදනය, කෘෂිකාර්මික පාඨමාලා සඳහා 80% කට වැඩි ප්‍රතිශතයකින් කාන්තා නියෝජනය පැවතුණි.

- තාක්ෂණ හා කාර්මික විද්‍යාල හරහා NVQ 3 , 4 හා NVQ 5 ,6 පාඨමාලා පවත්වාගෙන යනු ලැබූ අතර NVQ 3 ,4 සහතිකපත්‍ර 8,698 ද NVQ 5,6 සහතිකපත්‍ර 2,173 ක්ද NVQ නොවන සහතිකපත්‍ර 3,143 ලෙස මුළු සහතික පත්‍ර 14,014ක් නිකුත් කර ඇත.

- 2018/2019 අධ්‍යයන වර්ෂවල ඩිප්ලෝමා පාඨමාලා (NVQ5) සහ උසස් ඩිප්ලෝමා පාඨමාලා (NVQ 6) සම්පූර්ණ කළ සිසුන් 1,395 දෙනෙකුට 2022.03.11 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති උත්සවයේදී ඩිප්ලෝමා සහතිකපත් ප්‍රදානය කරන ලදී. තවද, 2020/2021 වසර සඳහා සුදුසුකම් ලැබූ සිසුන් 2,309 දෙනෙකු සඳහා ඩිප්ලෝමා සහතික ප්‍රදානය කිරීම සඳහා දෙවන ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය 2022.11.22 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාතන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි.

- 2022 වර්ෂය සඳහා සුදුසුකම් ලැබූ සිසුන් සඳහා රු. මි. 71.10 වටිනාකමකින් යුත් සිසු සවිය ශිෂ්‍යත්ව ආධාර සිසුන් 17,770 කට ලබා දී ඇත.

- 2022 වර්ෂය සඳහා ශිෂ්‍ය සුභ සාධන කටයුතු වෙනුවෙන් රුපියල් මිලියන 1.9 ක් සහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර වෙනුනේ රුපියල් මිලියන 33 ක් වෙන් කර තිබුණි. එයින් ශිෂ්‍ය සුභ සාධනය සඳහා රුපියල් මිලියන 1.39 ක් හා දුම්රිය වාරප්‍රවේශ පත්‍ර සඳහා මිලියන 50.22 වැය කර ඇත.

- මැණික් හා ස්වර්ණාභරණ පාඨමාලාව වැඩිදියුණු කිරීම හා බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකර ගැනීම අරමුණු කර මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය සමඟ පස් අවුරුදු අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර මරදාන, යාපනය, බෙලිඅත්ත, මැදගම,මඩකලපුව, ගාල්ල යන විද්‍යාල වල පාඨමාලා ඉදිරියේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇති අතර මඩකලපුව කාර්මික විද්‍යාලයේ පාඨමාලාව ආරම්භ කරන ලදී.

- ඇළුමිනියම් පිළිසකරකරණය කිරීමේ පාඨමාලාව වැඩිදියුණු කිරීම සඳහා ඇලුමෙක්ස් (Alumex) ආයතනය සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී. එමඟින් ඇලුමිනියම් පිළිසකරකරණය පාඨමාලාව සඳහා ගම්පහ, කළුතර,කුලියාපිටිය යන කාර්මික විද්‍යාල සඳහා අවශ්‍ය පුහුණු අමුද්‍රව්‍ය ලබා දී ඇත.

- තාක්ෂණ විද්‍යාලවල පුහුණු ධාරිතාව උපරිම මට්ටමට ඉහළ නැංවීම සඳහා ඒකීය වාස්තු විද්‍යාත්මක සැලසුමක් යටතේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා 2021 අයවැය යෝජනා අනුව "ටෙක් උදාන" වැඩසටහන යටතේ තාක්ෂණ විද්‍යාල වන කුරුණෑගල 55% ක් , මහනුවර 70% ක්, මරදාන 40% ක් ලෙස භෞතිකව වැඩ නිම කර ඇති අතර කාර්මික විද්‍යාල වන හෝමාගම 90% ක්, දඹුල්ල 80% ක් සහ මාතර 70%ක් ලෙස නවීකරණය කිරීමේ වැඩ නිම කර ඇත.

- වාර්ෂික අයවැය ප්‍රතිපාදන යටතේ කුලියාපිටිය කාර්මික විද්‍යාලයේ කෘෂිකර්ම නිෂ්පාදන තාක්ෂණ පාඨමාලාව හදාරන සිසුන්ට ආකර්ශණීය ප්‍රායෝගික පුහුණු පරිසරයක් සඳහා පහසුකම් සැලසීම සඳහා නවීන තාක්ෂණික කෘෂි ගොවිපොළ ඒකකයක් ස්ථාපිත කර ඇත.

- කුලියාපිටිය කාර්මික විද්‍යාලයේ දැනට පවතින බේකරි සහ සූපශාස්ත්‍ර පාඨමාලාව සඳහා අංග සම්පූර්ණ පහසුකම් සහිතව පුහුණු මුළුතැන්ගෙය ඒකකයක් රුපියල් මිලියන 5.4 ක වියදමින් ස්ථාපිත කල අතර සූපවේදී පාඨමාලාව සඳහා සිසුන් 115 ක් හා බේකරි පාඨමාලාව සඳහා සිසුන් 60 දෙනෙකු බඳවාගෙන පුහුණු කටයුතු සිදු කරන ලදී. මීට සමගාමීව PIZZA HUT ආයතනයේ සමාජ සත්කාර වැඩසටහන යටතේ Quick Service Restaurant, NVQ 4 පාඨමාලාව 2023 වර්ෂයේ සිට ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

- වෘත්තීය අධ්‍යාපන ප්‍රවර්ධන ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් යටිතල පහසුකම් වැඩිදියුණු කරමින් කාර්මික විද්‍යාල සංවර්ධන කරන ලදී. අවිච්ඡේද ව්‍යාපෘති කටයුතු සම්පූර්ණ කිරීම සඳහා රුපියල් මිලියන 34.36ක් වෙන් කල අතර රුපියල් මිලියන 25.10ක් වැය කර සියලු ව්‍යාපෘති නිම කරන ලදී.

- කොරියානු අධාර යටතේ ක්‍රියාත්මක වන තාක්ෂණ විද්‍යාලවල හා කාර්මික විද්‍යාලවල ඉදිකිරීම් පාඨමාලා යාවත්කාලීන කිරීම සඳහා ධාරිතා වර්ධන ව්‍යාපෘතිය යටතේ මරදාන, රත්නපුර, රත්මලාන, මාතර තාක්ෂණ හා කාර්මික විද්‍යාල වල සැලසුම් ශිල්පය (Draughtmanship , NVQ 4), පරිසණක ආශ්‍රිත සැලසුම්කරණ තාක්ෂණය (Drafting Technology , NVQ 5) සහ කාර්මික ජලනල ශිල්පය (Industrial Plumbing NVQ 3/4) පාඨමාලා සංවර්ධනය සඳහා කොරියානු අධාර යටතේ ඇ.ඩොලර් මිලියන 4 ක් ලැබීමට නියමිත අතර කොරියනු විශේෂඥ ව්‍යාපෘති කණ්ඩායම හා ඒකාබද්ධව ව්‍යාපෘති කටයුතු සිදුකරමින් පවතී. හඳුනාගත් වැඩහල් නවීකරණ කටයුතු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

- කොරියානු ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභී විද්‍යාල හතරෙහි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අදාළ උපදේශකවරුන් සඳහා සැලසුම් ශිල්පය, සැලසුම් ශිල්පි තාක්ෂණය, කාර්මික ජලනල ශිල්පය යන විෂයන් පිළිබඳ ඉගෙනුම් අත්පොත් සංස්කරණය පිළිබඳ මූලික පුහුණු වැඩසටහන් පවත්වන ලදී. මීට සමගාමීව ඉදිකිරීම් අංශය සඳහා රැකියාගත පුහුණු උපායමාර්ග සකස් කිරීම පිළිබඳව වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන් හා කර්මාන්ත අංශය දැනුවත් කිරීම සඳහා වැඩමුළු පවත්වන ලදී.

- සැලසුම් ශිල්පය, සැලසුම් ශිල්ප තාක්ෂණය හා කාර්මික ජලනල ශිල්පය යන පාඨමාලාවන් වල වැඩහල් සම්මත තත්ත්වයට ප්‍රතිනිර්මාණය කර සංවර්ධනය කිරීම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරමින් පවතින අතර 30% ක් පමණ භෞතික ප්‍රගතියක් ලබා ඇත.

- වෘත්තීය පුහුණු වැඩසටහන් සහ ස්වයං රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණ හා කාර්මික විද්‍යාල අශ්‍රිතව තරුණ තරුණියන් 10,563ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 224ක් පවත්වා ඇත.

- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) සමඟ සම්බන්ධීකරණයෙන් මධ්‍යම, සබරගමුව, බස්නාහිර සහ වයඹ පළාත් නියෝජනය කරන තාක්ෂණ හා කාර්මික විද්‍යාල වල විදුලි (Electrical), පෑස්සුම් ශිල්පය (Welding) සහ යන්ත්‍රණ ශිල්පය (Mechanical) යන විෂයන් හදාරන සිසුන් 20 දෙනෙකු සිංගප්පූරුවේ විදේශ රැකියා සඳහා යොමු කිරීම සඳහා Zoom තාක්ෂණය ඔස්සේ අදාළ ආයතනයේ නිලධාරීන් විසින් සම්මුඛ පරීක්ෂණයට යොමු කරන ලදී. සිංගප්පූරුවේ රැකියා සඳහා සිසුන් 14 දෙනෙකු සුදුසුකම් ලබා ඇත.

- තාක්ෂණ විද්‍යාල සහ කාර්මික විද්‍යාල සඳහා සිසුන් බඳවා ගැනීම ඉහළ නැංවීමේ අරමුණින් රූපවාහිනී, ගුවන් විදුලි, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ඔස්සේ සම්පත් දායකයින්ගේ දායකත්වයෙන් වෘත්තීය අධ්‍යාපනය පිළිබඳව ප්‍රචාරණ වැසටහන් 7 ක් පවත්වන ලදී.

- තාක්ෂණ හා කාර්මික විද්‍යාල මඟින් පුහුණුව ලැබූ ස්වයං රැකියා ක්ෂේත්‍රය වෙත යොමු වීමට අපේක්ෂාවෙන් සිටින තරුණ තරුණියන් උදෙසා ව්‍යාපාර සැලස්මක් සකස් කිරීමට අදාළව දින 10 ක දැනුවත් කිරීමේ මාර්ගගත වැඩසටහනක් පවත්වන ලද අතර ස්වයං රැකියා අපේක්ෂිතයින් ඒ සඳහා යොමු කරන ආයතනයක් වන SIYB මඟින් සංවිධානය කරන ලදී. එමෙන්ම තෝරාගත් ව්‍යවසායකයින් සඳහා ජපන් ආධාර ව්‍යාපෘති අරමුදල යටතේ (JICA Grant) රු.මිලියන 39.8 මුදලක් ප්‍රදානය කර ඇත.

2.2 2023 වර්ෂය සඳහා ඉලක්ක සහ අනාගත දැක්ම

- 2023 වර්ෂය සඳහා තාක්ෂණ විද්‍යාල 09 සහ කාර්මික විද්‍යාල 30 හි විවිධ අංශ 18ක් යටතේ පාඨමාලා 119 ක් සඳහා සිසුන් 30,000 ක් බඳවා ගැනීමට සැලසුම් කර ඇත. මේ යටතේ NVQ 5 හා 6 ඩිප්ලෝමා පාඨමාලා 38ක් NVQ 3 හා 4 පාඨමාලා 81ක් ද ඇතුළුව විද්‍යාල 39 හි වැඩසටහන් 900ක් පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

- 2023 වර්ෂයේදී පුහුණුව අවසන් කරන සිසුන් සඳහා NVQ 3, 4 සහතික පත්‍ර 8,300ක්, NVQ 5, 6 සහතික පත්‍ර 1,600 ක් සහ දෙපාර්තමේන්තු සහතික පත්‍ර පාඨමාලා සඳහා සහතික 12,900ක් ඇතුළුව සහතික පත්‍ර 22,800 ක් නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

- විදේශ රැකියා වෙළඳපොළට ගැලපෙන පරිදි ජලනල තාක්ෂණය, මෙකාට්‍රොනික්, සයිබර් ආරක්ෂිත තාක්ෂණය සහ වායු හා වාප පෑස්සුම් වැනි පාඨමාලා හා කාන්තා නැඹුරු පාඨමාලා වන බේකරි සහ සූපවේදය, බතික්, මැහුම්, කෘෂිකාර්මික නිෂ්පාදන තාක්ෂණය, ලේකම් පරිවය, පරිසණක තොරතුරු තාක්ෂණය, යතුරුලියනය හා ලඝුලේඛණ පාඨමාලා පුළුල් කිරීමටත් සැලසුම් කර ඇත.

- 2021 වර්ෂයේ අයවැය යෝජනා යටතේ ක්‍රියාත්මක වූ ටෙක් උදාන සංවර්ධන වැඩසටහන යටතේ කුරුණෑගල, මහනුවර, මරදාන තාක්ෂණ විද්‍යාල සහ හෝමාගම, දඹුල්ල හා මාතර යන කාර්මික විද්‍යාල වඩාත් ආකර්ශනීය පුහුණු මධ්‍යස්ථාන බවට පත් කිරීම සඳහා ඒකීය වාස්තු විද්‍යාත්මක සැලසුමක් අනුව ප්‍රතිසංස්කරණය අවසන් කර 2023 වර්ෂයේ දී උපරිම ධාරිතාවයෙන් සිසුන් බඳවා ගැනීමට අපේක්ෂා කෙරේ.

- කොරියානු අධාර යටතේ ක්‍රියාත්මක කරනු ලබන ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ධාරිතා වර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රතිනිර්මාණය කරනු ලබන සැලසුම් ශිල්පී, පරිසණක සැලසුම් ශිල්පී විද්‍යාගාර හා කාර්මික ජලනල තාක්ෂණ වැඩහල් වල ප්‍රතිසංස්කරණ කටයුතු 2023 වර්ෂයේ මුල් කාර්තුව තුල නිම කිරීමට සැලසුම් කර ඇති අතර අදාළ විද්‍යාගාර හා වැඩහල් සඳහා පුහුණු උපකරණ සැපයීමෙන් අනතුරුව උපදේශකවරුන් පුහුණු කිරීම සඳහා ද්වි මාසික පුහුණු වැඩසටහනක් 2023 වර්ෂයේ දී පැවැත්වීමට සැලසුම් කර ඇත.

- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ හඳුනාගෙන ඇති පාඨමාලා වන සැලසුම්ශිල්පය, සැලසුම්කරණ තාක්ෂණය සහ කාර්මික ජලනල ශිල්පයට අදාළව ගුරුඅත්පොත් සකස් කිරීම අවසන් කර රැකියාගත පුහුණු

වැඩසටහන් (OJT) ශක්තිමත් කිරීමේ අරමුණින් පුද්ගලික කර්මාන්ත සම්බන්ධීකරණයෙන් පුහුණු උපායමාර්ග පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම, තෘතීය හා වෘත්තීය පුහුණු කොමිසම (TVEC) සහ ජාතික අධුනිකත්ව කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) යන ආයතන සමග ඒකාබද්ධව රැකියාගත පුහුණුව (OJT) නියමු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- කොරියානු ව්‍යාපෘතිය යටතේ වැඩිදියුණු කරනු ලබන ප්‍රතිලාභී විද්‍යාල 4 හි සැලසුම් ශිල්පී තාක්ෂණ පාඨමාලාව සඳහා වාර්ෂිකව සිසුන් 100 ක්ද කාර්මික ජලනල පාඨමාලාව සඳහා සිසුන් 200 ක්ද බැගින් පුහුණු කිරීමට සැලසුම් කර ඇත.

- හෝටල් හා සංචාර ක්ෂේත්‍රයේ පාඨමාලා පුළුල් කිරීමේ අරමුණින් පීසා හට් (Pizza Hut) සමාජ සත්කාරක මූල්‍යමය අරමුදල් යොදාගෙන හඳුනාගත් විද්‍යාල 10 ක පේස්ට්‍රි සහ බේකරි හා සූපවේදය පාඨමාලා වැඩිදියුණු කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කර උපකරණ මිලදී ගැනීමට කටයුතු සැලසුම් කර ඇත. බේකරි හා සූපවේදය පාඨමාලාව වැඩිදියුණු කිරීම සඳහා පීසා ගැමා ලංකා ආයතනය සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට කටයුතු සැලසුම් කර ඇති අතර පුහුණු වන සිසුන් 2023 වසර වන විට පීසා හට් ආපනශාලා ජාලයේ සාමාජිකයන් ලෙස බඳවා ගැනීමට සැලසුම් කර ඇත. ආරම්භක අදියර ලෙස කුලියාපිටිය සහ නුවරඑළිය කාර්මික විද්‍යාලවල පාඨමාලා ආරම්භ කිරීමට නියමිතය.

- ජර්මන් රජයේ මූල්‍ය අධාර යටතේ GIZ ව්‍යාපෘතිය මගින් හඳුනාගත් විද්‍යාල 11 ක විදුලිකාර්මික වැඩහල් යාවත්කාලීන කර සංවර්ධය කිරීමටත් එම ක්ෂේත්‍රයේ දැනුම යාවත්කාලීන කිරීමට උපදේශකවරුන් සඳහා පුහුණු වැඩසටහන් පැවත්වීමට ද සැලසුම් කර ඇත.

- තාක්ෂණ හා කාර්මික විද්‍යාල සඳහා 2024 වසරට සිසුන් බඳවා ගැනීම වැඩිකිරීම සඳහා ඉලක්ක කණ්ඩායම් වෙත වෘත්තීය හා කාර්මික පුහුණු පාඨමාලා පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 1,536 ක් පැවැත්වීමට සැලසුම් කර ඇත. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් අනෙකුත් වෘත්තීය පුහුණු ආයතන නියෝජිතයන්, පෞද්ගලික අංශය හා ඒකාබද්ධව සිදු කරනු ඇත.

- රැකියා සඳහා විදේශගත වන ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව හා රැකියාවේ යෙදී සිටියදී ඇතිවන ගැටළු අවම කිරීම සඳහා දැනුවත් කිරීම හා පුහුණුව ලබා දීම සඳහා තොරතුරු මධ්‍යස්ථාන 05 ක් දිස්ත්‍රික් මට්ටමින් ස්ථාපිත කිරීමට YouLead ව්‍යාපෘතිය හරහා නියමු වැඩසටහන් සැලසුම් කර ඇත.

- වායු හා වාප පෑස්සුම් තාක්ෂණය, මෝටර්රථ පින්තාරු කිරීම, ඇලුමිනියම් පිළිසකරකරණය, මෝටර් රථ වායුසමීකරණය, සූර්ය පද්ධති කාර්මික ශිල්පය, විදුලි කාර්මික ශිල්පය, ජලනල තාක්ෂණය, මෝටරථ විදුලි කාර්මික ශිල්පය, පටක රෝපණ තාක්ෂණ සහකාර වැනි කාර්මික ක්ෂේත්‍රයේ වැඩි ඉල්ලුමක් ඇති NVQ 3 , 4 මට්ටමේ පාඨමාලා සඳහා විද්‍යාලවල වැඩහල් පහසුම් වැඩිදියුණු කිරීමෙන් සිසුන් 5,900 ක් පමණ වැඩිපුර බඳවා ගැනීමට සැලසුම් කර ඇත.

- මෝටර්රථ තාක්ෂණය, ශීතකරණ හා වායු සමීකරණ, ඉදිකිරීම් තාක්ෂණය, විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය, තොරතුරු තාක්ෂණය, ලෝහ වැඩ, ලී වැඩ, කෘෂිකර්මාන්තය ආදි ක්ෂේත්‍ර සඳහා උපදේශකවරුන් 135 ක් හා ශිල්ප ප්‍රදර්ශකවරුන් 45 ක් බඳවා ගැනීමට සැලසුම් කර ඇත.

- මාර්ගගත අධ්‍යාපන ක්‍රමය ශක්තිමත් කිරීම සඳහා, සියලුම තාක්ෂණ සහ කාර්මික විද්‍යාල ආවරණය වන පරිදි ඉගෙනුම් ආධාරක සැපයීමට සැලසුම් කර ඇති අතර, විද්‍යුත් ඉගෙනුම්

ක්‍රමවේදය තවදුරටත් ප්‍රවලිත කිරීම සඳහා මාර්ගගත අධ්‍යාපන ක්‍රමයට ගැලපෙන පරිදි සියලුම විෂය නිර්දේශ සඳහා ඉගැන්වීම් ද්‍රව්‍ය සකස් කිරීමට සැලසුම් කර ඇත.

- අධ්‍යයන සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීම සඳහා ඉදිකිරීම්, මෝටර් රථ තාක්ෂණය, දැව කර්මාන්තය, ශීතකරණ හා වායුසමීකරණ, කාර්මික චිත්‍රකරණය, විදුලි හා ඉලෙක්ට්‍රොනික්, තොරතුරු තාක්ෂණය, ලෝහ වැඩ, කෘෂිකර්මාන්තය යන ක්ෂේත්‍රයන් සඳහා උපදේශකවරුන් 135 දෙනෙකු බඳවා ගැනීමටත් ශිල්ප ප්‍රදර්ශක තනතුරු 45 ක පුරප්පාඩු පිරවීමටත් සැලසුම් කර ඇත.

2.3 වෘත්තීය අධ්‍යාපනයේ අභියෝග

- සාමාජීය ආකමල්ප වල බලපෑම හේතුවෙන් වෙල්ඩින්, පෙදරේරු, ලී වැඩ වැනි පාඨමාලා සඳහා අඩු ශිෂ්‍ය ආකර්ෂණයක් පැවතීම.

- වෘත්තීය පාඨමාලා සඳහා වූ අඩු කාන්තා නැඹුරුතාවය.

- පසුගිය වසර වල රට තුල පැවති COVD 19 වසංගත තත්ත්වය හා පැවති ආර්ථික අස්ථාවරභාවය හේතුවෙන් තරුණ තරුණියන් කාර්මික පාඨමාලා සඳහා ඇතුලත් වීමට වඩා දේශීය හා විදේශීය නුපුහුණු රැකියා සඳහා යොමුවීමට වැඩි නැඹුරුතාවයක් දැක්වීම.

- විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සඳහා පාඨමාලා පැවැත්වීමට බොහෝ විද්‍යාල වල සුදුසු යටිතල පහසුකම් හා එම පුද්ගලයින්ට විශේෂිත වූ පාඨමාලා අවම වීම.

- පාසැල් අධ්‍යාපන පද්ධතියට අදාළව ජාතික මට්ටමේ විභාග (සා.පෙළ සහ උ.පෙළ) පැවැත්වීමේ කාල රාමුව වෙනස්වීම තුල පාඨමාලාවන් සඳහා සිසුන් බඳවා ගැනීමේ කාල රාමුව නොගැලපිම තුලින් ශිෂ්‍ය බඳවා ගැනීම් අඩුවීම.

- තාක්ෂණ හා කාර්මික විද්‍යාල වල අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු දීර්ඝ කාලීනව නොපිරවීම මගින් කාර්මික අධ්‍යාපනයේ ගුණාත්මක භාවයට සෘජුවම අහිතකර ලෙස බලපෑම.

3 වන පරිච්ඡේදය

වර්ෂය සඳහා සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය



ඒසිඒ-එෆ්

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
2022/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2022		සටහන	තක්ෂ 2022	2021	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		2,126,600,000	1,920,750,000	ඒසිඒ-3
-	තැන්පතු		122,458,485	263,046,547	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		49,035,304	50,910,534	ඒසිඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**2,298,093,789**	**2,234,707,081**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**2,298,093,789**	**2,234,707,081**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**22,389,241**		
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) -(ඈ)		**2,275,704,548**	**2,234,707,081**	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
1,915,738,033	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,852,603,617	1,579,526,764	
268,927,033	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	234,139,453	195,286,927	ඒසිඒ-2(ii)
82,186,099	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	61,984,606	34,095,848	
-	පොළී ගෙවීම්	8	-	-	
148,835	වෙනත් පුනරාවර්තන වියදම්	9	148,835		
2,267,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**2,148,876,511**	**1,808,909,539**	
	මූලධන වියදම්				
68,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	26,480,478	99,843,846	
40,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	7,334,749	170,242,765	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,500,000	හැකියා වර්ධනය	14	698,425	7,397,809	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
110,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**34,513,652**	**277,484,420**	
	තැන්පතු ගෙවීම්		125,475,446	216,595,373	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		28,190,299	53,324,104	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්				
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		153,665,745	269,919,477	
	මුළු වියදම් එ = (ඊ +උ +ඌ)		2,337,055,908	2,356,313,436	
2,377,000,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ - එ)**		**(61,351,360)**	**(121,606,355)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(61,351,360)**	**(154,652,403)**	ඒසිඒ-7 ඒසිඒ-3
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

2022/12/31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	8,526,577,933	8,488,861,066
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	92,982,034	113,827,039
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**8,619,559,967**	**8,602,688,105**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(12,714,959)	5,113,086
දේපළ පිරියත හා උපකරණ සංචිතය		8,526,577,933	8,488,861,066
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	105,696,993	108,713,953
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**8,619,559,967**	**8,602,688,105**

පිටු අංක 07 සිට 57 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 65 සිට 114 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුල පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත්, ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය : 2023. 02. 24	දිනය : 2023. 02. 23	දිනය : 2023. 02. 23

එම්.එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය"
පැලවත්ත බත්තරමුල්ල.

ඒස්. සී. ජගත්
අධ්‍යක්ෂ ජනරාල්
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
තැ. පෙ. 557, ඕල්කොට් මාවත, කොළඹ 10.

බී.ඒ.පී.පී. චිත්‍රානන්ද බමුණුආරච්චි
ප්‍රධාන ගණකාධිකාරි
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
ඕල්කට් මාවත, කොළඹ 10.

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

එස්ඩීඒ-සී

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව
2022/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2022	2021
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල් බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර ලාභ		
ආදායම් නොවන ලැබීම්		
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	133,190,187	123,257,357
අග්‍රිම ලැබීම්	2,126,600,000	1,920,750,000
අත්තිකාරම් අය කර ගැනීම්	50,651,499	52,018,908
තැන්පතු ලැබීම්	122,458,485	263,046,547
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**2,432,900,171**	**2,359,072,812**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	2,075,363,757	1,774,167,996
සහනාධාර සහ මාරුකිරීම්	62,133,441	34,095,848
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	85,039,424	3,638,532
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	22,389,241	-
අත්තිකාරම් ගෙවීම්	27,985,210	53,090,642
තැන්පතු ගෙවීම්	125,475,446	216,595,373
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**2,398,386,519**	**2,081,588,391**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**34,513,652**	**277,484,421**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	34,513,652	277,484,421
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**34,513,652**	**277,484,421**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(34,513,652)**	**(277,484,421)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අනැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදි ඇතුළත් කර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* නම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

අදාළ නැත.

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගීකර ගැනීමේ කාර්යසාධනය

වියදම් ශීර්ෂ	වර්ෂය සඳහා වෙන් කල ප්‍රතිපාදන (රු.මිලි)	සංශෝශිත ප්‍රතිපාදන (රු.මිලි)	වියදම 2022 දෙසැම්බර් 31 දක්වා (රු.මිලි)	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
ප්‍රාග්ධන වියදම්	310.00	110.00	34.504	31%	80%
ගොඩනැගිලි හා ඉදිකිරීම්	205.00	55.50	19.373	34%	85%
යන්ත්‍රසූත්‍ර හා උපකරණ මිලදී ගැනීම	67.00	30.00	6.611	22%	70%
ලී බඩු හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම	13.50	9.00	0.625	0.65%	55%
යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අළුත්වැඩියාව	15.00	8.00	5.766	72%	80%
වාහන අළුත්වැඩියාව	7.00	6.00	1.432	23%	70%
මානව සම්පත් සංවර්ධනය	2.50	1.50	0.697	46%	75%
පුනරාවර්තන වියදම්	2,200.00	2,267.00	2,139.09	97%	100%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව,අනෙකුත් ආයතන / දෙපාර්තමේන්තු විසින් දරණ වියදම්

දෙපාර්තමේන්තු ශීර්ෂය	නියෝජිත ශීර්ෂය	වැය අංකය	මුදල (රු.)	ආයතනය	විස්තරය
215	306	1003	783,085.00	දුම්රිය දෙපාර්තමේන්තුව	නිදහස් වාර ප්‍රවේශ පත්‍ර
215	306	1003	1,400,560.00	දුම්රිය දෙපාර්තමේන්තුව	නිදහස් වාර ප්‍රවේශ පත්‍ර
215	306	1003	909,980.00	දුම්රිය දෙපාර්තමේන්තුව	නිදහස් වාර ප්‍රවේශ පත්‍ර
215	211	1201	414,720.00	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	ශිෂ්‍ය හැඳුනුම් පත මුද්‍රණය
215	641	1404	7,870,968.00	රේගු දෙපාර්තමේන්තුව	නිශ්කාෂණ ගාස්තු
එකතුව			11,379,313.00		

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2022.12.31. දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රුපියල්)	2022.12.31 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය (රුපියල්)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	2,540,819,569.10	2,540,819,569.10		*
9152	යන්ත්‍රෝපකරණ	1,341,258,909.76	1,341,258,909.76		98%
9153	ඉඩම්	4,308,992,250.00	4,308,992,250.00		*
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ	335,507,204.44	335,507,204.44		**
9180	බදු දෙන ලද වත්කම්				

***** අයිතිය තහවුරු නොවූ සහ තක්සේරු කිරීම සඳහා ඉදිරිපත් කල ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීමෙන් පසු ප්‍රාග්ධනිත කර ගිණුම් ගත කරනු ලැබේ

****** ආණමඩුව කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි කොන්ත්‍රාත්කරු විසින් සම්පූර්ණ ලෙස අඩුපාඩු නිම කිරීමෙන් පසු ප්‍රාග්ධනිත කරනු ලැබේ.

3.9 විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No.: VOT/E/DTET/2022/ FA/33
ඔබෙ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2023 මැයි 31

3 1 MAY 2023
අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

ගණන්දීමේ නිලධාරි,

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්. ආනන්ද
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත - ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } VOT/E/DTET/2022/ FA/33 මෙම අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 මැයි 2 වැනි

ගණන්දීමේ නිලධාරි,

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 215 - කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය නොකල මතය

ශීර්ෂය **215** - කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යයසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්වාගණනය නොකල මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී.මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූලය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම.

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ

වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තා

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) 3.1 ඡේදයේ සඳහන් කරුණ හැර ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ප්‍රතිපාදන ඉතිරි වීම

(i) 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය මඟින් වියදම් සීමාකර තිබූ අතර ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය හා සැසඳීමේ දී සියයට සියයක් ප්‍රතිපාදන ඉතිරි කල අවස්ථා 3 ක් නිරීක්ෂණය වූ අතර එහි වටිනාකම රු. 21,500,000 ක් විය.

(ii) උක්ත චක්‍රලේඛයට අනුගත වෙමින් දෙපාර්තමේන්තුව විසින් සියයට 50 කට වැඩි ප්‍රතිශතයකින් ප්‍රතිපාදන ඉතිරිකර තිබූ අවස්ථා 22 ක් නිරීක්ෂණය වූ අතර ප්‍රතිපාදන ඉතිරිය රු.81,281,556 ක් විය.

(ආ) නිසි අධ්‍යනයකින් හා නිවැරදි පුරෝකථනයකින් ඇස්තමේන්තු සකස් නොකිරීම හේතුවෙන් වැය විෂයයන් 19 කින් වෙනත් වැය විෂයයන් වෙත රු. 92,287,287 ක ප්‍රතිපාදන මාරු කර තිබූ අතර, මෙලෙස ප්‍රතිපාදන මාරු නොකෙළේ නම් මුල් ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය හා සැසඳීමේදී අදාල වැය විෂයයන්හි ඉතිරිය සියයට 4සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි.

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල බැඳීම් හා බැරකම් ප්‍රකාශණයේ දැක්වෙන වැය විෂයයන් 29 ක ශේෂයන් SA 92 භාණ්ඩාගාර පරිසණක මුද්‍රිතයේ දැක්වෙන ශේෂයන් අතර රු.882 සිට රු.32,943,562ක් දක්වා වූ පරාසයක වෙනස්කම් පැවතුණි.

(ආ) NVQ සහතික පත්‍ර මුද්‍රණය කිරීම වෙනුවෙන් 2022 අප්‍රේල් 02 සිට 2022 දෙසැම්බර් 22 දක්වා කාලසීමාව සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂම වෙත ගෙවිය යුතු රු.4,027,000 ක මුදල බැඳීම් හා බැරකම් ප්‍රකාශනය තුල ඇතුලත් කර නොතිබුණි.

2.3 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) තාක්ෂණ විද්‍යාල හා කාර්මික විද්‍යාල 12 ක හා දෙපාර්තමේන්තු ගිණුමට අදාලව නිකුත් කල එහෙත් ගෙවීම් සඳහා බැංකුව වෙත ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවූ චෙක්පත් වටිනාකම රු1,051,868 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තු ගිණුමට අදාලව නිකුත් කර මාස 06 ක් ඉක්ම ගොස් නිබුණද ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු නොකර 2017 වර්ෂයේ සිට ලද රු.1,036,913 ක්පොදු තැන්පත් ගිණුමට මාරු කර තිබුණි.

(ඇ) කාර්මික හා තාක්ෂණ විද්‍යාල 03ක 2022 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශවල හඳුනා නොගත් ලැබීම් ලෙස 2021 අගෝස්තු සිට 2022 දෙසැම්බර් දක්වා ලද, වටිනාකම රු. 55,000 ක් වූ ලැබීම් අවස්ථා 04ක් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 තැන්පතු ගිණුම් ශේෂ

පහත නිරීක්ෂණයන් කෙරේ.

දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන තැන්පතු ගිණුම් 03 හි සමාලෝචිත වර්ෂය අවසානයට අවුරුදු 2 ඉක්මවූ රු.21,513,909 ක තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2019 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවල නිර්දේශ කර තිබූ අපහරණය කල යුතු වත්කම් වර්ග 2922 ක් හා විකිණීම සඳහා නිර්දේශ කර තිබූ වත්කම් වර්ග 5432 ක වටිනාකම හඳුනාගෙන පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂවල සිට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ වලදී යම් යම් වත්කම් විකිණීම,වෙන්දේසි කිරීම ,විනාශ කිරීම සඳහා ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීමේදී ඒ අයුරින් ඉවත්කල භාණ්ඩවල පිරිවැය වටිනාකම හඳුනාගෙන ගිණුම් වලින් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම නිසා වත්කම්වල නිවැරදි වටිනාකම ගිණුම්වලින් නිරූපනය නොවන තත්වයක් පැවතුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලය හා විද්‍යාල 39 යන ආයතන 40 න් ආයතන 16 ක පමණක් ඉඩම් වල වටිනාකම රු. 4,308,992,250 ක් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කර තිබූ අතර අනෙක් ඉඩම් 24 හි වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) කාර්මික විද්‍යාල 23 කට අයත් ගොඩනැගිලි 287 ක වටිනාකම ස්ථාවර වත්කම් ලේඛණය තුළ ඇතුලත් නොවීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල සඳහන් ගොඩනැගිලි වටිනාකමෙහි නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි විය.

3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 හා 881 (i) ප්‍රකාරව කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව හා කාර්මික/තාක්ෂණ විද්‍යාල වල ඇප ලබා ගත යුතු නිලධාරීන් එම තනතුරට පත්කල දින සිට මාස 2 ක් ඇතුලත ඇප ලබාගත යුතු වුවත් කිසිදු නිලධාරියෙකුගෙන් ඇප ලබා ගෙන නොතිබුණි.

3.3 පාඩු හා හානි

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2012 වර්ෂයේ සිට පවතින රු.4,438,909 ක පොත් වලින් කපා නොහල හානි හා පාඩු වටිනාකමක් 2022 දෙසැම්බර් 31 දිනටද ඉදිරියට ගෙන ගොස් තිබුණි

(ආ) 2012 සැප්තැම්බර් 27 දින අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලයේ අධ්‍යක්ෂතුමා විද්‍යාලයට අයත් වැන් රථයක් පදවමින් සිටියදී හදිසි අනතුරකට ලක්වීය.මෙම නිලධාරියාගේ රියදුරු බලපත්‍රය අනුව පැදවිය නොහැකි වැන්රථයක් පැදවීමට අවසර ලබා දීම , අදාල වැන් රථය සර්වග්‍රාහී රක්ෂණයක් කර නොතිබීම සහ නිල රථය සඳහා ස්ථිර රියදුරෙකු ලබා නොදීම යන කරුණු මෙහිදී තහවුරු කරගෙන තිබුණි.මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) දෙපාර්තමේන්තු පරිපාලනය තම කාර්යයභාරය නිසි ලෙස ඉටු කර නොමැති වීම හේතුවෙන් මු.රෙ. 105 – (1) (ඇ) ප්‍රකාරව මෙම අනතුරෙන් දළ වශයෙන් ඇස්තමේන්තු කර ඇති රු. 1,047.899 ක අලාභය පියවා ගැනීමට තිබූ අවස්ථාව අහිමිව පැවති අතර දෙවන වරටත් පරීක්ෂණ කමිටුවක් පත්කර මුල් වාර්තාවෙන් නිර්දේශ කර තිබූ අයකරගත යුතු වටිනාකමෙන් සියයට 50 ක් පමනක් අයකර ගැනීමට නිර්දේශ කිරීම හේතුවෙන් අලාභයෙන් පියවාගත හැකිව තිබූ වටිනාකම රු. 196.482 කින් අඩු වී තිබුණි.

(ii) අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලයේ අධ්‍යක්ෂතුමාගේ විශ්‍රාම පාරිතෝෂිතයේ රඳවා තබාගෙන ඇති නිර්දේශිත අලාභය වන රු.327,468 ක මුදල අයකරගෙන ඉතිරි මුදල නිදහස් කිරීමට අනුමැතිය ලබා දී තිබුණද දෙපාර්තමේන්තුව විසින් එය රජයේ ආදායමට ගැනීම 2023 වර්ෂය දක්වා ප්‍රමාද කර තිබුණි.

(iii) එසේම අය කර නොගත් වටිනාකම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන රු.1,000,000 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට කපා නොහල හානි පාඩු ලෙස ගිණුම්වල පෙන්වා තිබුණි.

3.4 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) දෙපාර්තමේන්තුවේ TITP ගොඩනැගිල්ලේ දෙවන මහලේ දේශන ශාලා අංක 07 දේශන කටයුතු සඳහා වෙන් කර තිබුණ ද වසර ගණනාවක සිට දේශන ශාලාවක් ලෙස භාවිතා කිරීමේ පරමාර්ථයෙන් තොරව පරිපාලන අංශයේ ගබඩාවක් ලෙස භාවිතා කර තිබුණි. මෙහි කාර්යාලයක් සඳහා වෙන්කර ඇති වර්ග අඩි 400 ක පමන ප්‍රමාණයකින් යුතු අංක 20 දරණ කාමරය, වර්ග අඩි 50 කින් පමණ යුත් කුටි (CABIN) 07 කාමරය කිසිදු කාර්යයක් සඳහා භාවිතයට ගැනීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තු TITP ගොඩනැගිල්ලේ දෙවන මහලේ දේශන ශාලා අංක 07 කාමරය ආසන්නයේ වර්ග අඩි 60 කින් පමණ යුත් D 5 කාමරය තුළ භාවිතයට ගත හැකි තත්වයේ වලං, පිගන්, ඉලෙක්ට්‍රොනික් අයිතම, පරණ රූපවාහිනී යන්ත්‍ර, කැඩුණු පුටු,පොටෝ කොපි මැෂින්, කබඩ්, ප්‍රොජෙක්ටර්ස්, යතුරු සරනේරු,ගෑස් ටැංකියක් හා ඉනිමගක් ඇතුළු ද්‍රව්‍ය රැසක් අක්‍රමවත් ලෙස ගබඩා කොට පැවතුණි.

(ඇ) දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ සිට TITP ගොඩනැගිල්ලට ප්‍රවේශ වන පඩි පෙළ ආසන්නයේ ඉහළ මාලය තුළ හා TITP ගොඩනැගිල්ලේ දකුණු පස විදුලි සෝපානය ආසන්නයේ ස්ථාන කිහිපයක වැසි ජලය කාන්දුවීම හේතුවෙන් වැසි සහිත දින වලදී එම ස්ථානයේ බිමට ජලය කාන්දුවන අතර එම ස්ථානයන් දුර්වර්ණ වී තිබුණු අවස්ථා දීර්ඝ කාලයක සිට පැවතියද එය පිළිසකර කිරීමට අවශ්‍යය කටයුතු යොදා නොතිබුණි.

(ඈ) විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 2-14 වගන්තිය අනුව නිළධාරියකු විශ්‍රාම යාමේදී විශ්‍රාම වැටුප් අයදුම් පත්‍රය නිළධාරියා විශ්‍රාම යාමට නියමිත දින සිට මාස 03 කට පෙර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2021, 2022 වර්ෂ වල විශ්‍රාම ගිය නිලධාරීන් 20 කගේ විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ සලකා බැලීම සඳහා අදාල විශ්‍රාම වැටුප් අයදුම් පත් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීමේ දී මාස 2 ත් 10 ත් අතර කාල ප්‍රමාදයක් සහිතව ඉදිරිපත් කර තිබුණි.

(ඉ) 2022 අගෝස්තු මාසයේ පැවති NVQ Level 05 -December 2021 (April/May 2022) (semester 1)-Diploma in Food technology පාඨමාලාවට අදාලව ලිඛිත විභාගයට සිසුන් 90 ක් සඳහා ලබා දී තිබූ එක් විෂයයකට අදාල ප්‍රශ්න පෙර දින පැවති විෂයයකට අදාල ප්‍රශ්න පත්‍රයේ සඳහන් සියලුම ප්‍රශ්න විය. පසුව නිවැරදි ප්‍රශ්න පත්‍රය ලෙස විභාග අංශය මගින් විද්‍යුත් තැපැල (Email)

මාර්ගයෙන් ක්ෂණිකව ලබා ගෙන එහි මුද්‍රිත පිටපත් සිසුන් වෙත ලබා දී ප්‍රමාද වූ කාලය සම්පූර්ණ කර පිළිතුරු පත්‍ර එකතු කොට නිබුණි.

සකස් කරන ලද ප්‍රශ්න පත්‍ර අනුමත කිරීමේ දී නැවත පරීක්ෂාවක් සිදු නොවන බැවින් ඉහත තත්ව ඇතිවිය හැකි බවත් , ජාත්‍යන්තරව උසස් පිළිගැනීමකින්යුත් කාර්මික අධ්‍යාපනය හා පුහුණුව ලබා දීමේ ප්‍රමුඛයා වීම යන දැක්මෙන් යුතුව කටයුතු කරන මෙම දෙපාර්තමේන්තුව තුළ පාඨමාලා සඳහා විභාග පැවැත්වීම විනිවිධභාවයෙන් ඉහළ ගුණාත්මකභාවයෙන් යුතුව සිදු කිරීම අනිවාර්ය වුව ද මෙවැනි සිදුවීම් තුළින් විභාග ක්‍රමයේ රහස්‍යභාවය හා විශ්වාසනීයත්වයට දැඩි හානියක් සිදුවන තත්වයක් පැවතුණි.

(ඌ) දෙපාර්තමේන්තුව තුල සේවය කරන නිලධාරීන් සඳහා අදාල කරගත යුතු වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්ති 04 ක් පවතින අතර ඒවා විධිමත්ව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් නිලධාරීන් 91 දෙනෙකු දෙපාර්තමේන්තුව තුළ වසර ගණනාවක සිට එකම ස්ථානයක රැඳී සිටින තත්වයක් පැවතුණි.

(එ) දෙපාර්තමේන්තුවේ සිට වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු , පළාත් පාලන ආයතන වෙත ස්ථාන මාරු වී ගිය , මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කල, සේවය අතහැර ගිය, සේවය අවසන් කල නිළධාරීන් 59 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.4,595,847 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතු කර නොනිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව හා ඒ යටතේ ක්‍රියාත්මක වන තාක්ෂණ විද්‍යාල හා කාර්මික විද්‍යාල සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්ය මණ්ඩලය සඳහා තථ්‍ය කාර්ය මණ්ඩලය පරීක්ෂාවේදී තනතුරු 51 ක පුරප්පාඩු 1599 ක්ද තනතුරු දෙකක අතිරික්තතා 42 ක්ද විය.

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

4 වන පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

ආයතනයේ කාර්යසාධන දර්ශක

විශේෂිත දර්ශකය	කාර්ය සාධන දර්ශකය ගණනය කිරීම	සැබෑ ප්‍රතිඵලය අපේක්ෂිත ප්‍රතිඵලයේ ප්‍රතිශතයක් (%) ලෙස			විශේෂ කරුණු
		100 % - 90 %	75 %- 89%	50 %- 74%	
1. පාඨමාලා සම්පූර්ණ කරන ප්‍රතිශතය	පාඨමාලා සම්පූර්ණ ශිෂ්‍ය සංඛ්‍යාව X 100 බඳවාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව		√		
2. පුහුණු ධාරිතා උපයෝජන ප්‍රතිශතය	බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව X 100 බඳවාගත හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව		√		
3. ශිෂ්‍ය බඳවාගැනීමේ ප්‍රතිශතය	බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව X 100 ලැබූ මුළු අයදුම්පත් සංඛ්‍යාව		√		ලැබුනු අයදුම්පත් සංඛ්‍යාවෙන් 75% පමණ ඇතුලත් කරගෙන ඇත
4. ඒකක පුහුණු පිරිවැය (රු)	වාර්ෂික මුළු පුනරාවර්තන පිරිවැය වර්ෂයට බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව				රු. 67,627.27
5. රැකියාගතවීමේ ප්‍රතිශතය	රැකියාගත සංඛ්‍යාව X 100 පාඨමාලා සම්පූර්ණ කල සංඛ්‍යාව			√	
6. මුළු වියදම් සඳහා ආදායම් උත්පාදිත අරමුදල්	පාඨමාලා ගාස්තු ලෙස අයකල මුදල් ප්‍රමාණය x 100 වාර්ෂික මුළු පුනරාවර්තන වියදම				3%
7. පවතින අධ්‍යයන කාර්යමණ්ඩල ධාරිතාව	දැනට සිටින උපදේශක සංඛ්‍යාව x 100 අවශ්‍ය උපදේශක සංඛ්‍යාව				43 %
8. අනුමත සේවක සංඛ්‍යාව මත පදනම්ව උපදේශකවරුන්ගේ ධාරිතාව	දැනට සිටින උපදේශක සංඛ්‍යාව x 100 අනුමත සේවක සංඛ්‍යාව				46 %

5 වන පරිච්ඡේදය

තිරසර සංවර්ධන ඉලක්ක (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනාගත් තිරසර සංවර්ධන ඉලක්ක

ඉලක්කය අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	ඉලක්ක සපුරා ගැනීම පිළිබඳ දර්ශක	ඉලක්ක සපුරා ගැනීම් වල ප්‍රගතිය		
				0% - 49%	50% - 74%	75% - 100%
4.පරිපූර්ණ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.	4.3: 2030 වන විට, සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහල සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්ව විද්‍යාලය අධ්‍යාපනයද ඇතුලත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවීම.	4.3.1 ස්ත්‍රී පුරුෂභාවය අනුව පූර්ව මාස 12 තුළ විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය සඳහා යෙවනයන්ගේ සහ වැඩිහිටියන්ගේ සහභාගිත්ව අනුපාතය	වාර්ෂිකව බඳවාගත් කාන්තා සිසුන් සංඛ්‍යාව	√ 45% ක කාන්තා ශිෂ්‍ය සංඛාවක්		
	4.4: 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්ව සඳහා තාක්ෂණික සහ වෘත්තිය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයන් හා වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය මට්ටමකින් ඉහල දැමීම.	4.4.1 කුසලතාවයේ අකාරය අනුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කුසලතාවයන් යුක්ත යොවුන් සහ වැඩිහිටි ජනගහණයේ ප්‍රමාණය	වාර්ෂිකව බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව			√ ලැබුණු අයදුම්පත් වලින් 75 % පමණ සිසුන් බඳවා ගෙන ඇත.
	4.ඇ: 2030 වන විට අන්තර්ජාතික සහයෝගය තුළින් විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින කුඩා දිවයින් රාජ්‍යයන්හි සහ අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ සංවර්ධනය වෙමින් වෙමින් පවත්නා රටවල ගුණාත්මක වශයෙන් ඉහළ ගුරුවරුන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම.	4.ඇ1 අදාළ රටෙහි එක් එක් මට්ටම සඳහා ඉගැන්වීම සඳහා අවභ්‍ය වන පූර්ව සේවාස්ථ හෝ සේවාස්ථ (අ) පූර්ව ප්‍රාථමික, (ආ) ප්‍රාථමික , (ඇ) පහල ද්විතියික , සහ (ඈ) ඉහල ද්විතියික අධ්‍යාපනය යන අංශයන්හි අවම සංවිධානාත්ම පුහුණුව හෝ ලබා ඇති ගුරුවරුන් ප්‍රමාණය.	ධාරිතාව ගොඩනැගීම සඳහා පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය	√		
	4.5: 2030 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විෂමතා ඉවත් කර සමාන ප්‍රවේශයක් ලබා දීම. සමාජයේ සියළු මට්ටම් සහිත පුද්ගලයන්ට අධ්‍යාපනය සහ වෘත්තීය පුහුණුව ලබා දීම (ආබාධිතයන්, ආදිවාසීන් සහ අවදානමට ලක්විය හැකි තත්වයන් වල සිටින ළමුන්)	4.5.1 සියලු අධ්‍යාපනික දර්ශක සඳහා වන සමානාත්මතා දර්ශක වෙන්කොට දැක්විය හැකිය (ස්ත්‍රී/පුරුෂ, ග්‍රාමීය/නාගරික, ධනවත්භාවයේ මට්ටම යන පංචමකය සහ ආබාධිත මට්ටම, ස්වදේශීක ජනයා සහ ගැටුම් බලපෑම ආදී දත්ත පවත්නා බව අනුව)	වෘත්තීය පාඨමාලා බඳවා ගැනීම සඳහා සමාන අවස්ථා ලබා දීම ආබාධිත සිසුන් සඳහා පහසුකම් සහිත විද්‍යාල සංඛ්‍යාව ආර්ථික වශයෙන් සෞඛ්‍ය සම්පන්න නොවන පවුල් සඳහා ශිෂ්‍ය දීමනා සහ ශිෂ්‍යාධාර සංඛ්‍යාව		√	

5.2 තිරසර සංවර්ධන ඉලක්කවල ජයග්‍රහණ සහ අභියෝග

ජයග්‍රහණ

- ශිෂ්‍ය බඳවාගැනීම් වැඩි කිරීම සඳහා 2022 අයවැය මගින් විද්‍යාල වල භෞතික සම්පත් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලැබීම.

- 2022 වර්ෂයේ පැවති ආර්ථික අර්බුදය හමුවේ මාර්ගගත මෙන්ම භෞතිකව (මිශ්‍රව) පාඨමාලා පැවැත්වීම.

- හඳුනාගත් කර්මාන්ත පාඨමාලා සඳහා ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයක් ලබා දීම සහ ශිෂ්‍ය සුභසාධන පහසුකම් ලෙස සහනදායී වාර ප්‍රවේශපත්‍ර ලබා දීම.

- දේශීය හා ජාත්‍යන්තර වශයෙන් අධීක්ෂණ මට්ටමේ රැකියා සඳහා සුදුසුකම් ලැබූ සිසුන් 3800 ක් සඳහා NVQ 5 සහ 6 මට්ටමේ ඩිප්ලෝමා සහතික 2022 වර්ෂයේදී ප්‍රදානය කිරීමට හැකිවීම.

- විදේශීය මූල්‍ය පාර්ශවකරුවන්ගේ (කොරියානු රජය, එක්සත් ජනපද ආධාර) සහයෝගය ලබාගෙන පාඨමාලා නවීකරණය කිරීමට හැකිවීම.

- හෝටල් ක්ෂේත්‍රයට අදාල පාඨමාලා ආරම්භ කිරීම හා පුළුල් කිරීම සඳහා පෞද්ගලික ආයතන සමඟ එකාබද්ධ අවබෝධතා ගිවිසුම් ක්‍රියාත්මක කිරීම.

- ඉගනුම් මාර්ගෝපදේශ සංවර්ධනය ආරම්භ කිරීම මඟින් පාඨමාලා යාවත්කාලීන කිරීම සහ රැකියාගත පුහුණු ක්‍රියාවලිය නිසි අයුරින් සිදු කිරීම.

අභියෝග

- සමාජීය ආකල්ප හේතුවෙන් වෙල්ඩින්,පෙදරේරු , ලී වැඩ වැනි කර්මාන්ත පාඨමාලා සඳහා සිසුන්ගේ අඩු ආකර්ෂණයක් පැවතීම.

- වෘත්තීය පාඨමාලා සඳහා කාන්තා සිසුන්ගේ සහභාගීත්වය සාපේක්ෂව අඩුවීම.

- විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සඳහා පහසුකම් සහිත යටිතල පහසුම් සහ විශේෂිත පුහුණු පාඨමාලා නොමැතිවීම.

- වෘත්තීය අධ්‍යාපන අංශයේ හඳුනාගත් අංශවල පුරප්පාඩු පිරවීමට හැකියාවන් ඇති වෘත්තිකයින් බිහිනොවීම හේතුවෙන් වෘත්තීය අධ්‍යාපනයේ ගුණාත්මකභාවයට වක්‍රව බලපෑම් ඇති කරයි.

- නවීන තාක්ෂණය මෙන්ම කාර්මික අංශයට අදාළ නව තාක්ෂණට අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය යාවත්කාලීන නොවීම.

6 වන පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යාව කළමනාකරණය

වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු / (අතිරික්ත)
ජේෂ්ඨ	1315	586	729
තෘතියික	144	56	88
ද්විතීක මට්ටම	1191	900	291
ප්‍රාථමික	1176	735	441
එකතුව	3826	2227	1599

6.1.1 2021.12.31 දිනට සේවක පුරප්පාඩු

වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
අධ්‍යයන	1345	565	780
අනධ්‍යයන	2481	1662	819
එකතුව	3826	2227	1599

6.1.2 කාර්යසාධනය මත අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු වල බලපෑම

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 50% පමණ වන අතර මේ වන විට බාහිර උපදේශකවරුන් යොදා ගනිමින් පුහුණු පාඨමාලා පවත්වාගෙන යනු ලැබේ. කාර්මික අධ්‍යාපනය හා පුහුණුව මඟින් වඩාත් වෘත්තීය රැකියා අවස්ථා වෙත යොමු කර හැකි පාඨමාලාවලට අදාළ වන ගුරු පුරප්පාඩු 135 ක් පිරවීම ප්‍රමුඛතාවයක් ලෙස හඳුනාගෙන ඇති අතර මෙමඟින් කාර්මික අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමට සෘජු බලපෑමක් ඇති කල හැක.

6.2 මානව සම්පත් සංවර්ධන කාර්යසාධනය

උද්ගත වූ කෝවිඩ් හා සමාජ ආර්ථික තත්ත්වය හමුවේ සැලසුම් කළ පරිදි පුහුණු වැඩසටහන් සියල්ල පැවැත්වීමට අපහසු විය. මාර්ගගත ක්‍රමය ඔස්සේ දේශීය පුහුණු වැඩසටහන් බහුතරයක් පවත්වන ලදී

6.2.1 2022 වර්ෂයේ පවත්වන ලද පුහුණු වැඩසටහන්

	වැඩසටහන	පුහුණුව ලැබූ කාර්යමණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව	මුළු ආයෝජනය (රු)		වැඩසටහන් ස්වභාවය (දේශීය/ විදේශීය)	ප්‍රතිඵලය
				දේශීය	**විදේශීය**		
1	රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව- දිවයින පුරා භාෂා ප්‍රවීණතා වැඩසටහන - චක්‍රලේඛ අංක-**18/2020** (පැය **150**)	79	2022.05.09 - 2022.10.07 දක්වා	රු 112,500.00		දේශීය	**භාෂා කුසලතා වැඩි දියුණු කිරීම**
2	ඵලදායිතාව සහ ගුණාත්මක සේවා ස්ථානය පිළිබඳ පුහුණු වැඩසටහන	60	2022.05.16	ඵලදායිතා ලේකම් කාර්යාලය මගින් සංවිධානය		දේශීය	**කාර්යාල පරිසරය සත්‍රීය කිරීම**
3	මධ්‍යස්ථාන කළමනාකරුවන් සඳහා ධනාත්මක ආකල්ප සහ කාර්ය සාධනය පදනම් කරගත් කළමනාකරණය වැඩිදියුණු කිරීමේ වැඩමුළුව	47	2022.10.26.- 2022.10.28 දක්වා	**USAID** අනුග්‍රහය		දේශීය	**ආකල්ප වැඩිදියුණු කිරීම**
4	වෘත්තීය පරිපාලක පුහුණුව (මාර්ගගතව)	02	2022.03.28 - 2022.04.28		මාර්ගගත	දේශීය	**ධාරිතාව ගොඩනැගීම**
5	**Alumax** සමාගම විසින් ඇලුමිනියම් පිළිසකරකරනය සඳහා **TOT** වැඩසටහන (සිංහල මාධ්‍යය)	07	2022.05.31	මාර්ගගත		දේශීය	**කුසලතා වැඩි දියුණු කිරීම**
6	ඇලුමිනියම් පිළිසකරකරනය සඳහා **TOT** වැඩසටහන (දෙමළ මාධ්‍යය) **Alumax** සමාගම විසින් කෙතඩ් සහ කරෙයිනගර් හි වෘත්තීය පුහුණු අධිකාරිය	05	2022.09.16	අනුග්‍රහය Alumax ආයතනය		දේශීය	
7	දින **06**ක් සඳහා ආහාර විද්‍යාව හා තාක්ෂණයේ දියුණුව සඳහා **TOT** වැඩසටහන	04	2022.07.07 - 08 2022.07.14 - 15 2022.07.21 - 22	මාර්ගගත		දේශීය	
8	**KOICA** ප්‍රදාන වැඩසටහනේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ධාරිතාව ගොඩනැගීම සහ රැකියාගත පුහුණු සඳහා උපාය මාර්ගය සංවර්ධනය කිරීම **1** වන වැඩමුළුවේ	20	2022.08.09		KOICA	දේශීය	**ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පාඨමාලා සඳහා OJT උපාය මාර්ග සංවර්ධනය**
9	**KOICA** ප්‍රදාන වැඩසටහනේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ධාරිතාව ගොඩනැගීම සහ රැකියාගත පුහුණු සඳහා උපාය මාර්ගය සංවර්ධනය කිරීම **2** වන වැඩමුළුවේ	20	2022.09.15		**K**OICA	දේශීය	
10	**KOICA** ව්‍යාපෘතිය යටතේ අධ්‍යයන මාර්ගෝපදේශ සංවර්ධනය පිළිබඳ වැඩමුළුව	17	2022.07.20		KOICA	දේශීය	**සැලසුම් ශිල්පය සහ සැලසුම් ශිල්පී තාක්ෂණය සහ කාර්මික ජලනල සඳහා දැනට පවතින විෂයමාලා සංශෝධනය කිරීම මගින් අධ්‍යයන මාර්ගෝපදේශ සකස් කිරීම**
11	**KOICA** ව්‍යාපෘතිය යටතේ අධ්‍යයන මාර්ගෝපදේශ සංවර්ධනය පිළිබඳ වැඩමුළුව	21	2022.08.17		KOICA	දේශීය	
12	**OJT** ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා **TOT** වැඩසටහන (දින **07**)	20	2022.10.13 - 21		KOICA රු. 1,045,000.00		**දේශීය ඉදිකිරීම් කර්මාන්තය තුළ OJT සංස්කෘතිය ඇති කිරීම**
13	**SLTES II** නිලධාරීන් සඳහා දින **45** ක ධාරිතාව වර්ධන පුහුණු වැඩසටහන		2022 දෙසැම්බර් - 2023 ජනවාරි	රු.480,555.56		දේශීය	**කුසලතා වැඩි දියුණු කිරීම**

7 වන පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය අනුකූලවේ/අනුනකූල (නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම.	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1.	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත්කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ.	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් “ බී” ගිණුම.	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් වාණිජ) (අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්.	අදාළ නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්.	අනුකූල වේ.		
1.6	වෙනත්	අනුකූල වේ.		
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව 267/2018ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ(CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		

2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
3.	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම(මූ.රෙ.135)**			
3.1	ආයතනය තුළ මූල්‍ය බලතල පවරා දී තිබීම.	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ.		
3.3	සෑම ගණුදෙණුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ.		
3.4	අංක දරණ 171/204 දිනැති 2014.05.11 චක්‍ර ලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී එය ගණකාධිකාරීවරයාගේ පාලනයට යටත්ව ක්‍රියාත්මක කිරීම.	අනුකූල වේ.		
4.	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
5.	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ.		
6.	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු .රේ . 134 (2)DMA – 1/2019 අනුව වර්ෂය ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් පසු අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඇත.	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම.	අනුකූල වේ.		
6.3	අංක 40 (4) හි 2018දරණ පනතේ උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත්	අනුකූල වේ.		

	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.			
6.4	මු.රෙ.134 (3) ට අනුව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
7.	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA 1-2019 චක්‍රලේඛය අනුව වර්ෂය තුළ අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පවත්වා තිබීම.	අනුකූල නොවේ.	විගණන කළමනාකරණ කමිටු දෙකක් පවත්වන ලදි.	කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයට අනුව කටයුතු කිරීමට උපදෙස් දී ඇත.
8.	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 2017/01 හි 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන ලේඛනය ප්‍රකාරව එහි සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීමට සුදුසු නිලධාරියෙකු පත්කර ඒ පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කිරීම.	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 ට අනුව භාණ්ඩ සමීක්ෂණය පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ අදාළ කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල වේ.		
8.5	භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.177 අනුව සිදු කිරීම.	අනුකූල වේ.		
9.	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගනකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
9.2	වාහන ගර්භිත වී මාස 6 ට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109,110. ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ.		

9.5	අංක 2016/30 දරණ 2016.12.29 දිනැති ලේඛනයේ 3.1 පරිච්ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීම	අනුකූල නොවේ.	2022 වර්ෂයේ ඇති වූ ඉන්ධන අර්බුදය නිසා ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට නොහැකි විය.	2023 වර්ෂයේදී ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට සැලසුම් කර ඇත.
9.6	කල්බදු කාල සීමාව සම්පූර්ණ වාහනවල ලොග් පොත්වල අයිතිය පවරාගෙන තිබීම.	අනුකූල වේ.		
10.	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික , කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
11.	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම.	අනුකූල වේ.		
11.2	මු.රෙ.94 (1) ප්‍රකාරව උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම.	අනුකූල වේ.		
12.	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ.		
12.2	හිඟ ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම.	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ.	රු.148,835.37 ක මුදලක් ලෙජරයෙන් කපා හරින ලදි.	නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇත.
13.	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ.		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
14.	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ.		

14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ.		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පොත් සමග සැසඳීම.	අනුකූල වේ.		
15.	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස්කල ආදායමෙන් ආපසු ගෙවීම සිදුකොට තිබීම.	අනුකූල වේ.		
15.2	රැස්කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ.		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම.	අනුකූල වේ.		
16.	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම.	අනුකූල වේ.		
16.3	අංක 2017.09.20 හා 04/2017 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.		
17.	**මහජනයා වෙත තොරතුරු ලබා දීම.**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර ඒ තුළින් මහජනයාගේ ප්‍රශංසා හා චෝදනා පල කිරීමටද පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ.		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 8 හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට වතාවක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
18.	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	කළමනාකරණ අමාත්‍යාංශ චක්‍ර ලේඛ අංක 05/2018 (1) අනුව පුරවැසි ප්‍රඥප්තියක්	අනුකූල වේ.		

	සේවාලාභීන්ට සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.			
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය අනුව සේවාලාභී පුරවැසි ප්‍රඥප්තිය සම්පාදනය කිරීම් කටයුතු හා ක්‍රියාත්මක කිරීම / ඇගයීම සඳහා අධීක්ෂණ ක්‍රමවේදයක් ආයතනය විසින්ම සකස්කොට තිබීම.	අනුකූල වේ.		
19.	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	රාජ්‍ය පරිපාලන අංක 2018/02 හා 2018.01.24 දිනැති චක්‍රලේඛයේ ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම.	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම අත්සන් කර තැබීම.	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම,ධාරිතා සංවර්ධන වැඩසටහන් කිරීම,නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිලිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර තිබීම.	අනුකූල වේ.		
20.	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත්කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		